# 'ගිනස්' පොතට ඔබේ නමත්

## දහසක් මල්

ඔබට,

+ අවුරුදු 17 කට වැඩි කාලයක් හිට ගෙන ඉන්න පුළුවන් නම්,
+ අඟල් 26 ක් දිගට නිය පොත්තක් වවන්න පුළුවන් නම්,
+ පැය 34 ක් තනි කකුලෙන් හිට ගෙන හිටින්න පුළුවන් නම්,
+ තත්පර 12 කින් යාර 100 ක් පස්සට දුවන්න පුළුවන් නම්,

ඔබටත් පුළුවනි, ලෝක වාර්තාවක් පිහිටුවල ලෝක වාර්තා ඇතුළත් ගිනස් වාර්තා පොතට ඔබේ නම ඇතුළත් කර ගන්න.

ගිනස් වාර්තා පොත කියන්නෙ මොකක්ද ?

කවුද මේ පොත පටන් ගත්තෙ?

එහි ඇතුළත් පුදුම වාර්තා මොනවා ද?

දැන් කියවන්න ගිනස් වාර්තා පොතේ කථාන්තරය.

ගිනස් වාර්තා පොත බිහි වුන හැටිත් ලෝක වාර්තාවක් පිහිටුවීම වැනි රසවත් කතාවක්. යුරෝපයේ විශාල තම මත් ද්‍රව්‍ය ස්නාගාරය වූ සීමාසහිත ගිනස් සමාගමේ කළමණාකරණ අධ්‍යක්ෂවරයෙකුව සිටි 'හියු බීවර්' මහතා 1951 අවුරුද්දේ එක දවසක දඩයම් ගමනක යෙදී සිටිය දී කල්පනා කළා, වැඩියෙන් ම වේගයෙන් පියාසර කරන්න පුළුවන් මොන කුරුල්ලට ද කියලා. මේ විස්තරය හොයා ගන්න පොතක් ඒ කාලෙ තිබුනෙ නැහැ. බීවර් මහතා කල්පනා කළා ඒ වගෙ වාර්තා ඇතුළත් පොතක් ගිනස් සමාගම මගින් මුද්‍රණය කරන්න.

මේ වැදගත් කටයුත්ත භාර උනේ නෝරිස් මැක්වර්ටර් හා රොස් මැක්වර්ටර් කියන, නිවුන් සහෝදරයො දෙන්නටයි. 1925 අගෝස්තු මාසෙ 12 වෙනිද උපන් ඔවුන් දෙදෙනම නොයෙකුත් ප්‍රවෘත්ති, තොරතුරු හා සංඛ්‍යා ලේඛන ගැන සැලකිල්ලක් දක්වුවා. දෙදෙනාම හොඳ ක්‍රීඩකයින් වුනා. දෙවන ලෝක යුද්ධයේ දී රාජකීය නාවික හමුදාවේ උප ලුතිනන්වරුන් හැටියට සේවය කළා.

ඔක්ස්ෆඩ් සරසවියේ දී දෙදෙනාම දිවීමේ තරඟවලට සහභාගි උනා. එහි දී තොරතුරු සේවයක් ආරම්භ කළ නෝරිස් සහ රොස් පුවත්පත්, වාර්ෂික ග්‍රන්ථ, සහ විශ්ව කෝෂ යනාදියට තොරතුරු සපයන අතරම 'ක්‍රීඩක ලෝකය' යන නමින් මාසික සඟරාවක් ද බිහි කළා. 1975 දී රොස් මැක්වර්ටර් වෙඩි පහරක් වැදී මිය යාමෙන් පසුව දැන් ගිනස් වාර්තා පොතේ සංස්කාරක හැටියට කටයුතු කරන්නෙ නෝරිස් මැක්වර්ටර් මහතායි.

1954 දී බීවර් මහතා මේ දෙසොයුරන් හමු වී ලෝක වාර්තා පොතක් සකස් කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියා. ඊට මාස 11 කට පස්සෙ ගිනස් වාර්තා පොතේ කෙටුම්පත් පිටපත ගිනස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළහම ඔවුන් එය ඉතාමත් සන්තෝෂයෙන් පිළිගත්තා.

ගිනස් වාර්තා පොතත් ලෝක වාර්තාවක් පිහිට වලා තියෙනවා. එය කොතරම් ජනප්‍රිය ද කිව්වොත් ලෝකය පුරාම එම පොතේ; පිටපත් ලක්ෂ 400 ක් විකිණිලා තියෙනව. දැන් නිකුත් වන්නේ 26 වෙනි මුද්‍රණය යි. ඒ වගේ එංගලන්තයේ පුස්තකාලවලින් වැඩි වශයෙන් ම හොර කම් කර ගෙන යනු ලබන්නේත් ගිනස් වාර්තා පොතයි. දැන් එය භාෂා 23 කට පරිවර්තනය කර තියෙනව.

**අපේ රජ කෙනෙකුගෙ නමක්**

ගිනස් වාර්තා පොතට නම් ඇතුළත් කර ගන්න ලෝකය පුරාම ඉන්න නොයෙක් තරාතිර-

මේ අය උත්සාහ ගන්නව. වැඩිම කාලයක් තනි කකුලෙන් හිට ගෙන සිටීම, දිය මතුපිට පාවීම සහ දහර නැටුමක යෙදීම ආදිය සම්බන්ධයෙන් ලංකාවෙ කුමාර් ආනන්දන් ගේ නම කීහිප වරක් ගිනස් වාර්තා පොතට ඇතුළත් උනා. අමුතු ක්‍රමයෙන් දුවලා ලෝක වාර්තාවක් පිහිටුවා තිබෙන්නෙ නව-සීලන්තයේ පෝල් විල්සන්. හුළඟ නොවදින්නට ගෙයි දෙර, ජනෙල් වහගෙන දහස් වරකට වැඩිය පුරුදු වෙලා, මහ රෑ පවා සැහෙන වෙහෙසක් දරලා, ඇමෙරිකාවෙ ලැන් මාර්ටින් කියන තරුණය ගොල්ෆ් බෝල හයක් එක උඩ එක තියල ලෝක වාර්තාවක් පිහිටුවල ගිනස් වර්තා පොතට සිය නම එක් කළා. ඇතැම් විට පිස්සු වැඩක් කියල හිතෙන විදිහෙ ලෝක වාර්තාත් පොතට ඇතුළත් වෙලා තියෙනව. මුළු සිරුරෙන් වැඩිම කොටස (15% ක් පමණ) පච්ච කොටා තියෙන කාන්තාව හැටියට වාර්තා ගත වෙලා ඉන්නෙ එංගලන්තයෙ රස්ට් ස්කියුස් මහත්මිය යි.

වාර්තා පොතට නමක් ඇතුල් කිරීමට පෙර ඒ වාර්තාව තැබූ ආකාරය ගැන ඇසින් දුටු අය ගේ සාක්ෂි, පුවත් පත් වාර්තා, ඡායාරූප යනාදිය පරීක්ෂාවට ලක් වෙනව. නොයෙක් වතාවල දී බොරු කරල තමන් ගෙ නම ගිනස් වාර්තා පොතට ඇතුල් කර ගන්න නොයෙක් අය උත්සාහ කළා.

පට්ටම් 12 තියෙන පැන්ස තුනේ කාසි පට්ටම් උඩ එක පිට එක වැඩිම ගණනක් තියල වාර්තාවක් පිහිටුවල තියෙනව. මේ විදිහට වාර්තා වට ඇතුල් වෙලා තියෙන්නෙ කාසි 11 ක් තියලයි. වරක් එක් ඉංග්‍රීසි ජාතිකයෙක් තමන් එම වාර්තාව බිඳ දමූ බව පවසමින් කාසි 13 ක් එක උඩ එක තියල ගත්ත පිංතූරයක් ඉදිරිපත් කළා. සංස්කාරක නොරිස් මැක්වර්ටර් මහතාට සැක හිතිල ප්‍රශ්න කර ගෙන ගියහම ඔහු තමන් කරපු හොරය පිළිගත්ත.

ඔහු කරල තියෙන්නෙ හොඳට ඇලෙන මැලියම් වර්ගයකින් කලාලයත්, මේසයත් පුටුවත් සිවිලිමට අලවල විනිවිද පෙනෙන පටියකින් කාසි එක ළඟ එක හිටින්නට එල්ලන එකයි. පසුව එහි ඡායාරූපයක් අර ගෙන එය උඩ යට මාරු කළහම පෙනුනෙ හරියට කාසි 13 ක් පට්ටම් මත එක උඩ එක තියා ඇති සැටියට යි.

ගිනස් වාර්තා පොතේ නම ඇතුළත් කර ගන්න ලැබීම ලොකු භාග්‍යයක් වගේ ම රටටත් ගෞරවයක්. ගිනස් වාර්තා පොතෙහි අපේ සිංහල රජ කෙනෙකුගෙ නමක් සඳහන් වෙනවා. ඒ, ලෝකයේ ඉතාම කෙටි කාලයක් රජකම් කළ රජ්ජුරුවෝ හැටියටයි. 1196 දී රජකමට පත් වූ දෙවැනි වික්‍රමබාහු රජතුමා සිහසුනට තෝරාගෙන පැය කීපයකින් ඇතුළත සතුරන් විසින් මරාදමනු ලැබුවා.

* * *

# තෙල් නිපදවන තරම

තෙල් ! තෙල් !! තෙල් !!! අද ලෝකයේ කවුරුත් කථා කරන්නෙ තෙල් ගැන.

''තෙල් බලවත්තු'' හැටියට ප්‍රසිද්ධ රටවල් දවසකට තෙල් පීප්ප කොච්චර ප්‍රමාණයක් නිපද-වනවාද කියල නැගිලා, මල්ලිලා දැනගෙන ඉන්න එක හොඳයි. 1980 ජූලි මාසයේ ගණන් හිලව් වල හැටියට ඒ ඒ රටවල් දවසකට නිපදවූ තෙල් ප්‍රමාණය පීප්ප ගණනින් මෙහෙමයි.

| | | | |
|---|---|---|---|
| සවුදි අරාබිය | – | පීප්ප | 95,00,000 යි. |
| ඉරාකය | – | ,, | 34,00,000 යි. |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | – | ,, | 17,10,000 යි. |
| ඉරානය | – | ,, | 15,00,000 යි. |
| කුවායිට් | – | ,, | 15,50,000 යි. |
| කටාර් | – | ,, | 4,60,000 යි. |
| බහරේන් | – | ,, | 50,000 යි. |

මේ රටවල් ඔක්කොම දවසකට තෙල් පීප්ප 52,70,000 ක් නිපදවනවා.